

ජේසුතුමන් දිළිඳු වඩු පවුලත් තුළින් මෙලොවට පැමිණීමෙන් ලොවට දුන් පණිවිඩය කුමක්ද?

# නත්තලේ අරුත

**ශිරෝමා ප්‍රනාන්දු**

ජේසුතුමන් දිළිඳු වඩු පවුලත් තුළින් මෙලොවට පැමිණීමෙන් ලොවට දුන් පණිවිඩය කුමක්ද?

දෙවියන් වහන්සේ ගාබ්‍රියෙල් නම් දේවදුතයා ගලීලයේ නාසරෙන් නුවර විසූ දාවිත් පරපුරෙන් පැවත එන ජෝසප් නම් මනුෂ්‍යයකු හට විවාහ බස් දී සිටි කන්‍යාවක වෙත යවන ලදී. ඒ කන්‍යාවගේ නම මරියාය. දේවදුතයා ඈ සිටි තැනට පැමිණ ''විපුල ප්‍රසාද ලත් උත්තමාවණි ඔබට මංගල වේවා. ස්වාමීන් වහන්සේ ඔබ සමගය'' යයි කීය. මරියතුමිය ඒ වදන් අසා අතිශයින් කැළඹී මේ කෙබඳු ආචාරයක්දැයි සිත සිතා සිටියාය. දේවදුතයා ඇයට කතා කොට ''මරියාණෙනි, බිය නොවන්න, ඔබ දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය ලද්දේය. මේ බලන්න... ඔබ පුතකු ලබන්නෙහිය'' උන්වහන්සේට ජේසුස් යන නාමය තබන්න. ''උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක. පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක. උන්වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය දෙවි ස්වාමීන් වහන්සේ උන්වහන්සේට ප්‍රදානය කරන සේක. (ශු.ලූක් 1 පරි: 26-32 දක්වා)

දෙවියන් වහන්සේ විසින් තම ඒක ජනිත පුත්‍රයා මෙලොවට එවීමට තෝරාගන්නේ ඉතාමත් දුගී පවුලක් තුළින්ය. දෙවියන් වහන්සේගේ වචනය ලොවට බෙදන්නට පීඩිතයන් හට සැනසීම දෙන්නට ගලීල දේශයේ ජනතාව වෙත ජේසුතුමන් පැමිණියේ පීඩිත පන්තියේ පවුලකින් මිස රජ පවුලකින් නොවේ. ජේසුතුමන් රජ පෙළපතකින් මෙලොවට බිහිවූවා නම් එතුමන් හට කුරුස ගසේ මරණ දණ්ඩනය කිසිම දිනක හිමි නොවනු ඇත. සකල ජනයාගේ අවධානය තමන් වෙත පහසුවෙන් ලඟා කර ගත හැකි පහසු මාර්ගයක් තුළින් ජේසුතුමන් මෙලොවට එවීම දෙවියන් වහන්සේගේ පරමාර්ථය නොවීය.

ශ්‍රමය සූරාකන ධන කුවේරයන්ගේ හා අදුරදර්ශී දුෂිත පාලකයින්ගේ පවුලක හැදෙනවාට වඩා පීඩිත පන්තියේ දරුවකු ලෙස හැදී වැඩී පීඩිතයන්ගේ දුක අත්විඳ ඔවුනට ජීවිත අභියෝගවලට මුහුණදෙමින් තමාට ලැබී ඇති තලෙන්තු ලොවේ යහපතට දායාද කරමින් මැසිවිලි නොනගා ධෛර්යය වඩවා නතමාට මෙන්ම තම අසල්වැසියන්ටද ප්‍රේම කරමින් දිවි ගෙවන අයුරු පහදා දෙනු වස් ජේසුතුමන් දුප්පත් වඩු පවුලකට හිමිකම් කියමින් උපත ලැබීම දෙවියන්ගේ අභිප්‍රාය විය.

ජේසුතුමන්ගේ උපන මෙලෙසින් සිදුවීම කිතුණුවන් වන අප දකින්නේ කෙලෙසකද? ගවහලක උපන් නත්තල අද අප සමරන අයුර සහ සැබෑ නත්තලේ අරුත අහස පොළව මෙන් පරස්පර වන්නේද? නත්තල් සමග උදාවනවා සමග විදුලි බුබුළුවලින් අලංකාර වන නිවෙස්, කඩවීදි, සාප්පු සංකීර්ණ මිහිපිට සුරලොවක් නිර්මාණය කරවයි. නත්තල් ප්‍රීතිය වෙනුවෙන් තැන තැන දකින්නට ලැබෙන මේ සැනකෙලි සුවය විඳින්නට අකමැති වන්නේ ඉතා අල්ප දෙනෙකි. කිතුනුවන් නොවන අය පවා තම නිවසේ නත්තල් ගසක් සාදා නත්තල් අසිරිය විදහාපාමින් ආගමික සබැඳියාවද තහවුරු කරවයි. නත්තල වාණිජකරණවීම කූට වෙළෙඳ උපක්‍රමයක් සේ හන්වඩු ගැසී ඇතත් අද සෑම ආගමකට ආගමික උත්සව කූට වෙළඳුන්ගේ වෙළඳ විජ්ජා වල ග්‍රහණයට නතුවී හමාරය.
දෙවියන් විකුණා බඩ වඩා ගැනීම මිනිසුන්ගේ ක්‍රියාවක් වුවද එම ක්‍රියාවන් හෙළා දකින්නන් දොස් මුර නගන්නේ ඒ ඒ ආගම් නිර්මාතෘවරුන්ට හෝ ආගමික නායකයින්ටය. ඒ කෙසේවෙතත් අද වාණිජකරණයට පත්වී ඇති නත්තලට එම අරුත් සුන් බව ලඟාකරදීමේ වරදට අපි සැවොම වගකිවයුතු වෙමු.

අප ලබැඳි සබැඳියන්ගේ විශේෂ අවස්ථාවලදී අප මුදල් වැයකොට ප්‍රිය සම්බාෂණ පැවැත්වීම සාමාන්‍ය කරුණකි. අප ආදරය කරන හිතවතුන්ගේ ඡායාරූප අප ලග තබාගන්නේ ඔවුන් අපේ ජීවිතවල විශේෂ පුද්ගලයින් වන බැවිනි. කිතුනුවන් වන අපගේ මාර්ග උපදේශකයා වන ජේසුතුමන්ගේ උපත අපගේ ජීවිතවල අති විශේෂිත අවස්ථාවක් බව නොකිවමානය. එහෙයින් එතුමන්ගේ උපත සරමන නත්තල් දින අප නෑහිතවතුන් සමග එක් රැස්වී නත්තලේ ප්‍රීතිය හා සාමය බෙදා ගැනීම ඉතා යෝග්‍ය වේ. අප කුඩා කාලයේ නත්තල් නිවාඩුව අපහට ආශ්වාදජනක නිවාඩුවක් වන්නේ අපේ ගම්බිම් වලට ගොස් නිතර නොදකින නෑහිතවතුන් සමග දින කීපයක් හෝ ගත කරන්නට ලැබීමය. ජේසුතුමන් කිවූ පරිදිම උන්වහන්සේගේ නාමයෙන් අප නත්තල් දින එතුමන්ගේ දයාබර දරුවන් ලෙස එක්වී එතුමන් සිහිකරන විට නිතැතින්ම එතුමන් අප අතර වැඩසිටින නමුදු පුහු අටෝපනට පමණට වඩා මුදල් යටකරමින් මත්පැන්වලට ලොල්වමින් අනගා සළුපිළිවලින් සැරසෙමින් නත්තල් ප්‍රීතිය භුක්තිවිඳීම ජේසුතුමන්ගේ අභිප්‍රාය නොවන්නේය. එතුමන්ගේ ආගමනය ගැන යම් ප්‍රමාණයකට ප්‍රීතී ප්‍රමෝදවීම මනුෂ්‍යයින් වශයෙන් සාධාරණීකරණය කළහැකි නමුත් රජ මැදුරක බිහිනොවී ගවහලකින් මොලොවට වැඩියේ පව් ගෙවන්නන් අතර ජීවත් වී සමාජයේ පහත් යයි සලකන පව්කාරයින් යැයි සලකන පීඩිත පන්තිය තුළ හැදී වැඩී ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් එවකට පැවති නායකත්වය හමුවේ අභියෝගයන්වීමටය. මිනිසකුට විඳිය හැකි දරුණුම වද හිංසාවලට ලක්වූවත් කිසිදිනක එතුමන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් නොකළ සේක. නිර්දෝෂ වූ ජේසුතුමන් එතුමන්ගේ නිර්දෝෂත්වය සඳහා විලාත්තු ඉදිරියේ කතා නොකළ සේක.

ගෙත්සමෙනි මල් උයනේ එතුමන් අත්අඩංගුවට ගත් තැන්හි පේදුරු ගෝලයා විසින් සෙබලකුගේ කණ කැපූ විට ''පේදුරු නුඹ කඩුව කොපුවේ ලාගන්න, ඒ මන්දයත් අවිගත්තෝ අවියෙන්ම නසින්නේ යැයි'' වදාළ සේක. සමාජයේ පහත්කොට සලකන අය අතර ගැවසෙන්නේ මන්දැයි විමසූ විට වෙදකු අවශ්‍ය වන්නේ රෝගීන්ට බව වදාල සේක. එතුමන් දුගී පවුලකින් මෙලොවට ආ නමුත් ජීවිතයේ දුක් කරදර හමුවේ අධිෂ්ඨානපූර්කව මුහුණ දියයුතු අන්දම හෙළිකර දුන් සේක. කුරුසයේ අන්තිම හුස්ම හෙලන තුරුත් නැවත තුන් දිනකින් උත්ථානවීමෙන් අනතුරුව අද දක්වාත් අප හට මාර්ගය ද, සත්‍යයද ජීවිතය ද වූ සේක. අප කරනා සෑම වැඩකටයුත්තකටම අවශ්‍ය වන්නේ දෙවියන් වහන්සේ වෙත අප තබා ඇති විශ්වාසය බව එතුමන්ගේ ජීවිත ගමන තුළින් එය මොනවට පැහැදිලි කරදුන් සේක. හිංසාවාදය කිසිසේත් අනුමත නොකල ජේසුතුමා දෙවියන් වහන්සේ වෙනුවෙන් තම ප්‍රාණය පරිත්‍යාග කරනු විනා තම දෙවියන් වෙනුවෙන් හෝ අන්කුමන හේතුවක් මත හෝ පරපන නැසීම පාපයක් බව හෙළා දුටුසේක.

''මරිය මග්දලේනා හට ගල් ගසා මරා දමන්නට නියම වූ විට ජේසුතුමා ඉල්ලා සිටියේ එකම පවක්වත් නොකල අයකු පළමු ගල ගසන ලෙස ය, තම වචනය අවියක් ලෙස තියුණුව පාවිච්චි කරමින් එදා තිබූ පාලන ක්‍රමය, දූෂණ එතුමන් නිර්භය ලෙස විවේචනය කළ සේක. සත්‍ය වූ පසුතැවිල්ල සියලු පව් කමා කරන බව යාඥා කළ එතුමාගෙන් කල්වාරි කඳු මුදුනේදී දකුණේ වූ හොරා හට පව් සමාව ලැබිණි.

අද මුළු ලොව ත්‍රස්ත භයින් වෙව්ලුම් කා ඇත. පුරාණ ගිවිසුමේ මෙන් ඇසට ඇස දනට දන මෙන් පළිගැනීම පෙරදැරි කරගෙන ආගම්වාද යුධබිය හා දෙවියන් වෙනුවෙන් කරන ශුද්ධ වූ යුද්ධයක් නිසා අද මුළු ලොවම යුධ පිටියක් බවට පත්වී ඇත. ලොව නන් දෙසින් අද කිතුනුවා වෙත එල්ල වන තර්ජන හා චෝදනා හමුවේ කිතුනුවන් වශයෙන් අප වෙතින් ජේසුතුමා බලාපොරොත්තු වන්නේ කඩු කිනිසි ගෙන යුධ පිටියට යාම නොව දැඩි ඉවසීමෙන් හා විශ්වාසයෙන් යුතුව ජීවිත ගෙන යාම ය. ■

